**අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2017**

-------------------------------------------------------------- ------------------------

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය අතර 2016 දෙසැම්බර් 01 දින එළඹි හා 2017 අගෝස්තු 31 දින සංශෝධිත අංක සීඑල්කේ 1009 01 ආර් දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 වගන්තිය සහ 2017 අගෝස්තු 31 දින සංශෝධිත 3.4.4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහ ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් රැක ගනිමින් අනුරාධපුර නගරයේ පෞරාණික හා නවීකරණය වූ ප්‍රදේශ අතර සමබර සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම වේ. ණය පහසුකම් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 9,779.95 කට සමාන යුරෝ මිලියන 62.40 ක් වන අතර ඉන් රු. මිලියන 8,150 කට සමාන යුරෝ මිලියන 52 ක් සැපයීමට ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිත අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරුවනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

2017 දෙසැම්බර් 31 දිනට තිබුණු රු.359,234 ක ගෙවිය යුතු ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
| | යුරෝ | රු.මිලියන | රු.මිලියන | යුරෝ | රු.මිලියන | යුරෝ | රු.මිලියන |
| ප්‍ර.සං.නි | 52.00 | 8,149.96 | 275.00 | නැත | නැත | නැත | නැත |
| ශ්‍රී.ලං.ජ. | 10.40 | 1,629.99 | 39.00 | 0.33 | 52.01 | 0.44 | 69.56 |
| එකතුව | 62.40 | 9,779.95 | 314.00 | 0.33 | 52.01 | 0.44 | 69.56 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය පහසුකම් ගිවිසුමේ 4 උපලේඛනයෙහි III වගන්තිය අනුව, ණය පහසුකම් ගිවිසුම අත්සන් කළ දින සිට මාස 8 ක් ඇතුළත පළමු ප්‍රතිපූර්ණ අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විශේෂ (යුරෝ) ගිණුමක් විවෘත කිරීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය තුළ වැයකර තිබුණු රු.මිලියන 69.56 කට සමාන යූරෝ 443,812 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ණය පහසුකම් ගිවිසුමේ 3 උපලේඛණය ප්‍රකාරව, මූල්‍ය හා භෞතික ඉලක්කයන් දක්වා සමස්ථ ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි සර්ව සම්පූර්ණ ක්‍රියාකාරී සැලැස්මක් සහ සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛණයක් ව්‍යාපෘතිය මඟින් පිළියෙල කර නොතිබුණි.

**3.2 භෞතික කාර්යසාධනය**

නාගරික ජංගමත්වය ඉහළ නැංවීම, පොදු ස්ථාන වැඩිදියුණු කිරීම් ඉහල නැංවීම සහ ධාරිතා ගොඩනැංවීම යනාදි සංරචක 03 යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කරවීමට සැලසුම් කර තිබුණි. අනුරාධපුර නගරය වැඩිදියුණු කිරීමේ විස්තරාත්මක සංවර්ධන සැලසුම් සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණේ 2017 අගෝස්තු 29 දින වන අතර එම වැඩකටයුතු 2019 අප්‍රේල් 24 දින සම්පූර්ණ කිරීමට නියමිතය.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

ව්‍යාපෘතිය මඟින් කරගෙන යනු ලබන සිවිල් වැඩ සඳහා වන විස්තරාත්මක නිර්මාණ සැලසුම් සකස් කිරීමේ ප්‍රමාදයන් හේතුකොට ගෙන ව්‍යාපෘතිය මඟින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලසුමක් සකස් කර නොතිබුණි. එසේ වුවත්, ව්‍යාපෘතිය මඟින් පිරිවැය රු.මිලියන 5.97 ක් කාර්යාල උපකරණ මිලට ගැනීම සඳහා ව්‍යාපෘතිය මඟින් මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4(ඊ) ඡේදය ප්‍රකාරව ලංසුකරුවන්ගේ ලිපිනයන් පිළිබඳ වාර්තා සහ ලංසු විවෘත කිරීමේ ලියවිලි නියමිත ආකෘතියට අනුව පවත්වා නොතිබීම නිසා මේ සඳහා අනුගමනය කර තිබුණු ක්‍රියාපිළිවෙත විගණනයේදී තීරණය කළ නොහැකි විය.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ අනුමතත කාර්ය මණ්ඩලය තනතුරු 35 කින් සමන්විත වූ අතර ඉන් තනතුරු 10 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට පුරවා තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂ, අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ විශේෂඥයන් 03 දෙනෙකු සහ සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකු යනාදි වශයෙන් ප්‍රධාන තනතුර වර්ෂයකට වැඩි කාලයක් පුරප්පාඩුව පැවති අතර මෙය ව්‍යාපෘතියේ කටයුතු සුමට ආකාරයට කරගෙන යාම සඳහා බලපා තිබුණි.

(ආ) ප්‍රසම්පාදනය හා නාගරික සැලසුම්කරණය පිළිබඳ අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද නොමැති නිලධාරීන් දෙදෙනෙකු සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් ලෙස බඳවාගෙන අංක 1/2016 හා 2016 මාර්තු 24 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.2.9 ඡේදය ප්‍රකාරව පාරිශ්‍රමිකයන් තීරණය කර තිබුණු බව නිරීක්ෂණය විය.